ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන -පස්වන මට්ටම 2014/2015

අවසාන පරීක්ෂණය - 2016

සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් – ESU3231

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2016 අප්‍රේල් 09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. 'සෞන්දර්ය යනු රජය ජනිත කරවන මාධ්‍යයකි. අභ්‍යන්තරිකව කතා කළ හැකි භාෂාවකි' මෙම පාඨය කෙටියෙන් විග්‍රහ කරන්න.

02. 'සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්' යන්න පැහැදිලි කරන්න.

03. ද්විතියික ශ්‍රේණිවල අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් සඳහා සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් යොදා ගැනීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

04. නාට්‍ය හා රංගකලා ගුරුවරයකු වශයෙන් කටයුතු කිරීමේදී සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉගෙන ගැනීමේ වාසි තුනක් (03) දක්වන්න.

05. ශිෂ්‍යයන්ගේ නිර්මාණශීලී පරිකල්පනය වැඩි දියුණු කිරීම සඳහා කතාන්දර ගෙතීමේ ක්‍රමය දායක කර ගන්නේ කෙසේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න.

06. "නිර්මාණශීලීභාවය අධි ප්‍රජානන මානසික කුසලතාවකි." සෞන්දර්ය හා නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මෙම මානසික කුසලතාව සංවර්ධනය කිරීම සඳහා දායක කර ගත හැකි අන්දම කෙටියෙන් පෙන්වා දෙන්න.

07. සෞන්දර්යය විෂයයන් ඉගැන්වීමේදී ගුරුවරයකු විසින් සැලකිලිමත් විය යුතු කරුණු පහක් (05) දක්වන්න.

08. සෞන්දර්ය අධ්‍යාපනයේ පොදු පරමාර්ථය සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

00052

## 2 වන කොටස

09. (i) භාවමය බුද්ධිය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ii) භාවමය බුද්ධිය සංවර්ධනය කිරීම සඳහා ගුරුවරයකු වශයෙන් ක්‍රියාකළ යුත්තේ කෙසේදැයි සුදුසු නිදසුන් යොදා ගනිමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

10. (i) නාට්‍ය හා රංගකලා විෂයය ඉගෙනීමෙන් ශිෂ්‍යයන් ලබන ප්‍රතිලාභ පහක් (05) නම් කරන්න. (ලකුණු 10)

(ii) ඉන් ඕනෑම ප්‍රතිලාභයක් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

11. (i) ප්‍රාථමික අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ගේ ඉගෙනුම් අවස්ථා සඳහා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් (චිත්‍ර/නර්තනය/නාට්‍ය/සංගීතය) යොදා ගැනීමේ දී සැලකිලිමත් වියයුතු කරුණු මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) කුඩා දරුවන්ගේ සමස්ත සංවර්ධනය කෙරෙහි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් උපකාරී වන අන්දම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. "දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනයේ දී සෞන්දර්ය ගුරුවරයාගේ භූමිකාව අතිශයින් වැදගත් වේ." මෙහි සත්‍යාසත්‍ය බව විමසන්න. (ලකුණු 20)

13. පහත මාතෘකා අතරින් ඕනෑම මාතෘකා දෙකක් (02) සඳහා කෙටි සටහන් ලියන්න.

(i) ශිෂ්‍යයන්ගේ චිත්තවේග සංවර්ධනය සඳහා කවි/ගීතවල ඇති වැදගත්කම

(ii) සෑම දරුවකු සඳහා ම නිර්මාණශීලි ඉගෙනුම් පරිසරයක අවශ්‍යතාව

(iii) ශිෂ්‍යයන්ගේ ඉහළ ප්‍රජානන හැකියා සංවර්ධනය සඳහා සකස් විය යුතු ගුරු භූමිකාව.

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.